# පොල් පර්යේෂණ ආයතනය
# தென்னை ஆராய்ச்சி நிறுவனம்
# COCONUT RESEARCH INSTITUTE

Gen. Tel.: 031 - 2255300, 031 - 2262000, 031 - 2262001
Fax. : 031 - 2257391, 031 - 2255583

බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානය, ලුණුවිල 61150, ශ්‍රී ලංකා.
பண்டிரிப்புவ ஆராய்ச்சி நிலையம், லுணுவில 61150, இலங்கை.
Bandirippuwa Research Centre, Lunuwila, 61150, Sri Lanka.

Chairman / CRB : 031 - 2255497
Director / CRI : 031 - 2255890
E-mail : directorcri@sltnet.lk


මගේ අංකය/எனது இல. / My ref

ඔබේ අංකය/உமது இல. / Your ref.

හිතවත් මහත්මයාණෙනි/ මහත්මියෙණි,

**පොල් වගාව සහ අගය එකතු කළ පොල් නිෂ්පාදන පිළිබඳ**
**සහතික පත්‍ර පාඨමාලාව - 2024**

නව තාක්ෂණය අනුව පොල් වගා කිරීම සහ පොල් ඉඩම් කළමනාකරණය පිළිබඳ උනන්දුවක් දක්වන වගාකරුවන් සඳහා පොල් වගාව සහ අගය එකතු කළ පොල් නිෂ්පාදන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (වැඩසටහන් 8 කින් සමන්විත) 2024 වසරේදී ද පැවැත්වීමට පොල් පර්යේෂණ ආයතනය සැලසුම් කර ඇත.

එක් එක් වැඩසටහන පොල් වගාවට විශේෂිත වූ එක් විෂයක් සඳහා වෙන් කර ඇත. (වැඩ සටහන් විස්තරය මේ සමඟ අමුණා ඇත).සියලු වැඩසටහන් වලට දේශන හා ක්ෂේත්‍ර ආදර්ශන ඇතුළත් වන අතර, ප්‍රායෝගික කරුණු පිළිබඳ වැඩි අවධානයක් මෙහිදී යොමු කෙරේ. මෙම වැඩසටහන මූලික වශයෙන් උදෑසන න්‍යායාත්මකව ඉදිරිපත් කිරීම් සිදුකරන අතර, සවස් වරුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ.

මෙම වැඩසටහන් මාලාව සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, එක් එක් වැඩ සටහන සඳහා අදාළ අත් පත්‍රිකා හා කුඩා පොතක්ද සපයනු ලැබේ. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ වියදම් (දිවා ආහාරය, උදේ සහ සවස කෙටි කෑම සමග තේ, අත් පත්‍රිකා සැපයීම ආදිය) සඳහා එක් වැඩසටහනකට එක් අයෙකුගෙන් රු.2000.00 ක මුදලක් අය කරනු ලැබේ.

තමන්ගේ අවශ්‍යතාව අනුව කැමති පරිදි වැඩසටහන් සියල්ලටම හෝ තෝරාගත් වැඩසටහන් කිහිපයකට වුව ද සහභාගි විය හැක. වැඩසටහන් 8න්, අවම වශයෙන් 7 කටවත් සහභාගි වන අය සඳහා පමණක් වැඩසටහන් මාලාව අවසානයේ වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ. ඔබ මෙම අධ්‍යාපනික වැඩසටහන් වලට සහභාගි වීමට උනන්දුවක් දක්වන්නේ නම්, ඔබගේ සහභාගීත්වය ලියාපදිංචි කිරීම සඳහා මේ සමඟ එවා ඇති ආකෘති පත්‍රය පුරවා 2024.02.28 වන දිනට පෙර අප වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි,
මෙයට විශ්වාසී,

ආචාර්ය චමින්ද හේරත්
අංශ ප්‍රධානි
තාක්ෂණ භුවමාරු අංශය
2024.02.02

**පොල් වගාව සහ අගය එකතු කළ පොල් නිෂ්පාදන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - 2024**

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 01** | - | **පොල් නැවත සිටුවීම සහ පැළ වගා පාලනය කිරීම** |
| දිනය | - | 2024.03.12 |
| ස්ථානය | - | අඹකැලේ හුදකලා බීජ පොල් උයන, අඹකැලේ, පල්ලම. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 02** | - | **පොල් අස්වනු කෙරෙහි කාලගුණයේ බලපෑම සහ පොල් ඉඩම් වල තෙතමන සංරක්ෂණය** |
| දිනය | - | 2024.04.02 |
| ස්ථානය | - | රත්මලාගාර උප පර්යේෂණ මධ්‍යස්ථානය, පනිරෙන්ඩාව, මාදම්පේ. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 03** | - | **පොල් වගාව සඳහා පොහොර භාවිතය, පසේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ඉඩම් යෝග්‍යතාවය** |
| දිනය | - | 2024.05.07 |
| ස්ථානය | - | ප්‍රධාන කාර්යාලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 04** | - | **පොල් ඉඩම්වලින් අතිරේක ආදායමක් ලබා ගත හැකි අතුරු බෝග වගාව** |
| දිනය | - | 2024.06.04 |
| ස්ථානය | - | මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය , මාකඳුර. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 05** | - | **පොල් වගාවේ පළිබෝධ හා රෝග පාලනය** |
| දිනය | - | 2024.07.02 |
| ස්ථානය | - | ප්‍රධාන කාර්යාලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 06** | - | **අඩු ඵලදාවක් සහිත පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම, වල් මර්දනය, සත්ත්ව පාලනය සහ වාරි ජල සම්පාදනය** |
| දිනය | - | 2024.08.06 |
| ස්ථානය | - | රත්මලාගාර උප පර්යේෂණ මධ්‍යස්ථානය, පනිරෙන්ඩාව, මාදම්පේ. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 07** | - | **වැඩි ආදායමක් ලබා ගැනීම සඳහා පොල් ඉඩම් කළමනාකරණය සහ කම්කරු නීතිය** |
| දිනය | - | 2024.09.03 |
| ස්ථානය | - | ප්‍රධාන කාර්යාලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

| | | |
|---|---|---|
| **වැඩසටහන් අංක 08** | - | **පොල් ආශ්‍රිත නව නිෂ්පාදන** |
| දිනය | - | 2024.10.01 |
| ස්ථානය | - | ප්‍රධාන කාර්යාලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල. |
| වේලාව | - | පෙ.ව 09.00 සිට ප.ව 05.00 දක්වා |
| අය කිරීම | - | එක් පුද්ගලයෙකු සඳහා රු. 2000.00 |

**පුහුණු වැඩසටහනේ ඉල්ලුම්පත්‍රය**

**පොල් වගාව සහ අගය එකතු කළ පොල් නිෂ්පාදන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

2024 වර්ෂයේදී පැවැත්වීමට නියමිත ඉහත පාඨමාලාව සඳහා, ..............................................................
..................................................... වන මා සහභාගි වන බව මෙයින් දන්වා සිටිමි.

මා විසින් සහභාගි වීමට නියමිත වැඩසටහන/වැඩසටහන් පහත පරිදි වේ. (සහභාගි වීමට නියමිත වැඩසටහන ඉදිරියෙන් √ සලකුණ යොදන්න)

| වැඩසටහන් අංකය | වැඩසටහන | දිනය | සහභාගි වීම |
|---|---|---|---|
| 01 | පොල් නැවත සිටුවීම සහ පැළ වගා පාලනය කිරීම | 2024.03.12 | |
| 02 | පොල් අස්වනු කෙරෙහි කාලගුණයේ බලපෑම සහ පොල් ඉඩම් වල තෙතමන සංරක්ෂණය | 2024.04.02 | |
| 03 | පොල් වගාව සඳහා පොහොර භාවිතය, පසේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ඉඩම් යෝග්‍යතාවය | 2024.05.07 | |
| 04 | පොල් ඉඩම්වලින් අතිරේක ආදායමක් ලබා ගත හැකි අතුරු බෝග වගාව | 2024.06.04 | |
| 05 | පොල් වගාවේ පළිබෝධ හා රෝග පාලනය | 2024.07.02 | |
| 06 | **අඩු ඵලදාවක් සහිත පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම, වල් මර්දනය, සත්ත්ව පාලනය සහ වාරි ජල සම්පාදනය** | 2024.08.06 | |
| 07 | වැඩි ආදායමක් ලබා ගැනීම සඳහා පොල් ඉඩම් කළමනාකරණය සහ කම්කරු නීතිය | 2024.09.03 | |
| 08 | **පොල් ආශ්‍රිත නව නිෂ්පාදන** | 2024.10.01 | |

මෙම වැඩසටහන සඳහා වන රු. .................. ක මුදල අංක ................................................ දරණ මුදල් තැන්පතු පත්‍රිකාව මෙයට අමුණා එවා ඇත.

මෙයට,

............................................... ...........................................

අත්සන දිනය

**(නිවැරදිව පුරවන ලද මෙම ආකෘති පත්‍රය සහ අදාළ මුදල් තැන්පතු පත්‍රිකාව 2024 පෙබරවාරි මස 28 දිනට ප්‍රථම අප වෙත එවන පළමු 200 දෙනෙකුට පමණක් ඉහත වැඩසටහනට සහභාගි වීමට අවස්ථාවක් ලැබෙන බව කාරුණිකව දන්වා සිටිමි.)**

---

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ඔබගේ පහත සඳහන් තොරතුරු අප වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.**

නම - ..........................................................................................................

දුරකථන අංකය - ජංගම - ..........................................
නිවස - ..........................................
කාර්යාලීය - ..........................................

පුද්ගලික ලිපිනය - ..........................................................................................................
..........................................................................................................

වත්තේ අක්කර ප්‍රමාණය - ..........................................................................................................

වත්තේ ලිපිනය - ..........................................................................................................

පොල් පර්යේෂණ ආයතනය
தென்னை ஆராய்ச்சி நிறுவனம்
COCONUT RESEARCH INSTITUTE

Gen. Tel.: 031 - 2255300,
031 - 2262000, 031 - 2262001
Fax. : 031 - 2257391, 031 - 2255583

බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානය, ලුණුවිල 61150, ශ්‍රී ලංකා.
பண்டிரிப்புவ ஆராய்ச்சி நிலையம், லுணுவில 61150, இலங்கை.
Bandirippuwa Research Centre, Lunuwila, 61150, Sri Lanka.

Chairman / CRB : 031 - 2255497
Director / CRI : 031 - 2255890
E-mail : directorcri@sltnet.lk

මගේ අංකය/எனது இல. / My ref

ඔබේ අංකය/உமது இல. / Your ref.

හිතවත් මහත්මයාණෙනි/මහත්මියෙණි,

**පොල් වගාව සහ අගය එකතු කළ පොල් නිෂ්පාදන පිළිබඳ**
**සහතික පත්‍ර පාඨමාලාව - 2024**

**වැඩ සටහන් අංක 01 - පොල් නැවත සිටුවීම සහ පැළ වගා පාලනය කිරීම**

ඉහත පාඨමාලාවේ 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත පළමුවන වැඩසටහන 2024 මාර්තු මස 12 වන අඟහරුවාදා පෙ.ව 09.00ට පල්ලම, අඹකැලේ හුදකලා බීජ පොල් උයනේදී පැවැත්වීමට තීරණය කර ඇත.

වැඩසටහනේ අරමුණු වන්නේ, පොල් නැවත වගාව, උසස් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, පැළ සිටුවීමේ නිවැරදි ක්‍රම හා පැළ වගා නඩත්තුව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම වේ.

මෙම වැඩ සටහනට සහභාගි වන ලෙස ඔබට මෙයින් ආරාධනා කෙරේ.

මෙම වැඩසටහනට අදාළ වන රු. 2000/- ක මුදල ලංකා බැංකුවෙහි ඕනෑම ශාඛාවක පහත සඳහන් කර ඇති ගිණුමට තැන්පත් කර මුදල් තැන්පතු පත්‍රිකාවෙහි පිටපත සමඟ 2024.02.28 වන දිනට පෙර අංශ ප්‍රධානි, තාක්ෂණ හුවමාරු අංශය, පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල යන ලිපිනයට මේ සමඟ එවා ඇති පළමු වැඩසටහනේ ආකෘති පත්‍රයද පුරවා එවීම අනිවාර්ය වේ. අදාළ තැන්පතු පත්‍රිකාවෙහි සඳහන් තැන්පත් කරන්නාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම් පත් අංකය, දුරකථන අංකය සහ තැන්පතු අවශ්‍යතාවය අනිවාර්යෙන්ම සඳහන් කළ යුතුය. මුදල් තැන්පතු පත්‍රිකාවෙහි මුල් පිටපත අප වෙත එවීමට ප්‍රථම, එහි ඡායා පිටපතක් ලබා ගන්නා ලෙසත්, එම ඡායා පිටපත වැඩසටහන පවත්වන දිනයේදී රැගෙන එන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි. තවද, මෙම ලිපියද රැගෙන ඒම අනිවාර්ය වේ.

ගිණුම් හිමියාගේ නම :- අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල

ගිණුම් අංකය :- 84044222

2024.02.28 දිනට පසු අප වෙත ලැබෙන මුදල් තැන්පතු පත්‍රිකාවන් භාර නොගන්නා අතර වැඩ සටහනට **සහභාගි වීමට අවස්ථාවක් සලසා දිය නොහැකි බවද කරුණාවෙන් දන්වා සිටිමි.**

කිසිදු චෙක්පතක්, අත් පිට මුදලක් හෝ මුදල් ඇණවුමක් භාර නොගන්නා අතර, එවැනි පුද්ගලයින්ට මෙම වැඩසටහනට සහභාගි වීමට අවස්ථාවක් සලසා දිය නොහැකි බවද කාරුණිකව දන්වා සිටිමි.

ඔබ විසින් අදාළ මුදල අප ආයතනයේ බැංකු ගිණුම වෙත තැන්පත් කරනු ලබන අවස්ථාවේදී තම ජාතික හැඳුනුම් පත් අංකය සහ ඔබගේ දුරකථන අංකය විශේෂයෙන් සඳහන් කරන ලෙස බැංකුව දැනුවත් කිරීමට කටයුතු කරන්න.

BANK OF CEYLON
BOC
Bankers to the Nation

මුදල් තැන්පතු පත්‍රිකාව பண வைப்புச் சீட்டு **Cash Deposit Slip** දිනය / திகதி / Date

ගිණුම්/කාඩ්පත් අංකය கணக்கு/அட்டை இலக்கம் Account/Card Number: 84044222

ගිණුම්/කාඩ්පත් හිමියාගේ නම සහ ලිපිනය : අඹකැලේ පොල් පර්යේෂණ ආයතනය
கணக்கு/அட்டை வைத்திருப்பவரின் பெயரும் முகவரியும் :
Account/Card Holder's Name and Address :

ගිණුම්/කාඩ්පත් හිමියා නොවන වෙනත් පාර්ශවයක් විසින් කරන රු. 200,000ට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்குரிமையாளர்/அட்டை வைத்திருப்பவர் அல்லாது மற்றவர்கள் ரூபா.200,000/-க்கு மேல் பணவைப்புச் செய்பவை
For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

තැන්පත් කරන්නාගේ නම සහ ලිපිනය / வைப்புச் செய்பவரின் பெயரும் முகவரியும் Depositor's Name and Address
ජා.හැ.ප/ගමන් බලපත් / රියදුරු බලපත් අංකය
தே.அ.அ/கடவுச்சீட்டு/சாரதி அனுமதிப்பத்திர இல./ N.I.C / P. P / D. L No.:
දුරකථන අංකය / தொலைபேசி இல./ Telephone No:
තැන්පතුවේ අවශ්‍යතාවය / வைப்பின் நோக்கம் / Purpose of Deposit: පුහුණු ශාලාව සඳහා
Ref No.
තැන්පත්කරුගේ අත්සන / வைப்புச்செய்பவரின் ஒப்பம் / Depositor's Signature
Valid Computer Print or Authorised Signature

| නෝට්ටු தாள்கள் Notes | රුපියල් / ரூபா / Rs. | | | ශත சதம் Cts. |
|---|---|---|---|---|
| 5000/- | | | | |
| 2000/- | | | | |
| 1000/- | | | | |
| 500/- | | | | |
| 200/- | | | | |
| 100/- | | | | |
| 50/- | | | | |
| 20/- | | | | |
| 10/- | | | | |
| කාසි நாணயங்கள் Coins | | | | |
| එකතුව மொத்தம் Total | | | | |

Validation checked

Boc/Supp/S 182433 Credit 1-2 Form No: 70176 UDAYA GRAPHICS - TEL 0115735397

වැඩසටහන පැවැත්වෙන දිනයේදී මුදල් ගෙවිය නොහැකි අතර, මුදල් ගෙවීමෙන් පසු මෙම වැඩ සටහනට සහභාගි නොවන්නේ නම් 2024.03.07 වන බ්‍රහස්පතින්දා දින ප.ව. 04.00 ට පෙර අප වෙත ලිඛිතව හෝ 070 400 1928 WhatsApp අංකයට දැන්වීමෙන් මෙම වැඩ සටහනට අදාළ මුදල් ඊළඟ වැඩ සටහනට බැර කළ හැකිය. එමෙන්ම පළමු වැඩසටහනේදී, වැඩ සටහන් 08 සඳහා ම මුදල් ගෙවා ලියාපදිංචි වී ඇත්නම් ඉහත පරිදි, ලියාපදිංචි වීමක් අවශ්‍ය නැත.

සැ.යු: මෙම මුදල් අය කිරීම සිදු කරනුයේ මේ සඳහා සහභාගි වන්නන්ට අවශ්‍ය සංග්‍රහ කටයුතු සිදු කිරීමට බැවින් ආහාර ඇනවුම් කිරීමට පෙර අප දැනුවත් කිරීම කළ යුතුය. දැනුම් දීමකින් තොරව සහභාගි නොවන්නේ නම් මෙම මුදල් ඉදිරි වැඩසටහනට බැර කිරීමට නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

වාහන වලින් පැමිණෙන අයට අඹකැලේ හුදකලා බීජ පොල් උයනට පැමිණිය හැකි මාර්ග විස්තරය මේ සමඟ එවා ඇත. බස් රථ වලින් පැමිණෙන අයට පහත සඳහන් පරිදි අප ආයතනය විසින් නොමිලේ ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ. මේ සඳහා යොදා ගනු ලබන්නේ මෙම ආයතනයේ නම සඳහන් අශෝක් ලේලන්ඩ් වර්ගයේ බස් රථයකි. ඔබ විසින් පොල් පර්යේෂණ ආයතනයේ බස් රථයෙන් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, පහත සඳහන් ස්ථාන වෙත පැමිණෙන ලෙසත් ප්‍රවාහන පහසුකම් පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා තුෂාර බණ්ඩාරනායක මයා 071-8435610/ 077-7704768, නීල් චන්ද්‍රන මයා 077-7490009, දිශාන්ත සෙනරත් මයා 077-9221476 යන අයගෙන් විමසන්න.

වැඩ සටහනට සහභාගීත්වය පිළිබඳව විස්තර සහ අනෙකුත් විස්තර සඳහා 031 –2257688 අමතා ආචාර්ය චමින්ද හේරත් මයා විමසන්න.

බස්රථය පිටත්වන වේලාවන් හා ස්ථාන පහත පරිදි වේ.

1. ලුණුවිල ප්‍රධාන කාර්යාලයේ සිට - පෙ.ව 06.45
2. වෙන්නප්පුව ප්‍රධාන බස් නැවතුම් පොලේ සිට - පෙ.ව 07.00
3. හලාවත නගර මධ්‍යයේ (වටරවුම අසල) සිට - පෙ.ව 07.45
4. ආරච්චිකට්ටුව මංසන්දියේ සිට - පෙ.ව 08.15
   (මෙම ස්ථානයේ බීජ පොල් උයනේ නම සඳහන් නාම පුවරුවක් ඇත)
5. ප්‍රමාද වී පැමිණෙන අය සඳහා නැවත වරක් ආරච්චිකට්ටුව මංසන්දියේ සිට- පෙ.ව 08.45

(වාහන තදබදය ආදී හේතූන් නිසා ඉහත වෙලාවන්හි සුළු වෙනස්කම් සිදුවීමට ඉඩ ඇත).

මෙයට විශ්වාසී,

ආචාර්ය චමින්ද හේරත්
අංශ ප්‍රධානි
තාක්ෂණ හුවමාරු අංශය
2024.02.02